# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බංගලා භාරකරු III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 17 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2025 ජුනි 20 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අංක 811/1 ඒ,ජයන්තිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, අයදුම්පත්‍රයේ අංක 01 සිට 09 තෙක් පළමුවන පිටුවටද, 10 සිට 14 තෙක් දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

| තනතුරු නාමය | සුදුසුකම්, වැටුප් පරිමාණ හා බඳවා ගැනීමේ ක්‍රමය | පැවරෙන කාර්යභාරය |
|---|---|---|
| බංගලා භාරකරු | ➢ **වැටුප් පරිමාණය :** මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වනුයේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අංක 10/2025 හි අංක III/ උපලේඛනය අනුව PL2 – 2025 වැටුප් කේතය යටතේ වන රු. 41,800-10x490-10x540- 10x590-12x630-65,560/- වැටුප් පරිමාණය වේ.<br>➢ **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබීම.<br>➢ **වෘත්තිය සුදුසුකම් :** ජාතික ආධුනිකත්ව මණ්ඩලය හෝ ලංකා සංචාරක මණ්ඩලය හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පවත්වනු ලබන සූපවේදය හෝ සංචාරක නිවාස නඩත්තුව පිළිබඳ N.V.Q දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හා පෙරදිග හා අපරදිග ක්‍රම දෙකෙන්ම ආහාර ආහාර පිළියෙල කිරීමේ හැකියාව හා ඉංග්‍රීසි කතා කිරීමේ හැකියාව තිබීම.<br>➢ **පළපුරුද්ද :** තනතුරට අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබීම.(අදාළ පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)<br>➢ **බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 1:5 අනුපාතයට ප්‍රායෝගික හා ව්‍යුහගත යන පරීක්ෂණ දෙකෙන් ම ලබාගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිවෙල අනුව පුරප්පාඩු වලට බඳවා ගැනීම කරනු ලැබේ. | 1. සංචාරක බංගලාවලට පැමිණෙන අමුත්තන් සුහඳව පිළිගැනීම, සංග්‍රහ කිරීම, ඔවුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.<br>2. සංචාරක බංගලාව සහ උද්‍යානය පිරිසිදුව හා අලංකාරව පවත්වාගෙන යාම.<br>3. සංචාරක බංගලාව නිසි පරිදි නඩත්තු කිරීම හා එහි සුරක්ෂිතභාවය පවත්වාගෙන යාම.<br>4. සංචාරක බංගලාවෙහි පවතින ද්‍රව්‍ය හා උපකරණ ලැයිස්තු නිසි පරිදි පවත්වාගෙන යාම.<br>5. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන තනතුරට අදාළ වෙනත් රාජකාරී කටයුතු ඉටුකිරීම. |

03. **සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :**

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.

04. **වයස :** අවු.18 ට නොඅඩු හා අවු.45 ට නොවැඩි විය යුතුය.

05. **කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

06, **වෙනත් :**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍ර යේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. **සම්මුඛ පරීක්ෂණය :**

❖ වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

❖ මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වුවහොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය අධ්‍යක්ෂ ජනරාල් සතුය.

❖ මෙම නිවේදනය සමග ඉදිරිපත් කර ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව සකස් කරන ලද ඉල්ලුම්පත් 2025 ජුනි 20 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජයන්තිපුර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලයෙන් යොමුකළ යුතුය. නොඑසේනම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතන අංශයට අතින් ගෙනවිත් භාරදිය යුතුය.

**එම්.එස්.එල්.ආර්.පී.මාරසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ)**